**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය) 200 මට්ටම - 2020 පෙබරවාරි - අප්‍රේල්**
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level –From February to April 2020**

## SINE 202 - නූතන සමාජයේ කාව්‍ය, ප්‍රබන්ධ කථා සහ නාට්‍ය

කාලය පැය (03) තුනයි.
එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට(05) පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව නවයකි (09).

---

### I කොටස

(1) **කොළඹ අවධිය** 'නූතන කවි යුගය' ලෙස හැඳින්වීමට හේතු වූ සාධක පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(2) "ළමා කාව්‍ය යනු, **නූතන යුගයෙහි ආරම්භක වකවානුව** නියෝජනය කළ කවීන් සොබාදහම සහ ළමා මනසේ වූ මුදු මොළොක් බව පිළිබඳ ගෙතූ සංවේදී හා නිර්මාණශීලී පද්‍ය නිර්මාණ වේ." ළමා පද්‍යයක පැවතිය යුතු මූලිකාංග පිළිබඳ ද අවධානය යොමු කරමින්, උක්ත ප්‍රකාශය විමර්ශනය කරන්න.

(3) "**නිසඳැස්/නිදහස්** කවියා ආමන්ත්‍රණය කළේ පාඨක හදවතට නොව, බුද්ධියට ය." මෙම කියමන සනිදර්ශන ව විවරණය කරන්න.

### II කොටස

(4) "**ශාකුන්තලය,** නාට්‍ය රසය අබිබවා කාව්‍ය රසය මතු කෙරෙන දෘශ්‍ය කාව්‍යයකි." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(5) උරුමය පිළිබඳ ගතානුගතික ආකල්පය බැහැර කළ බර්ටෝල් බ්‍රෙෂ්ට්, ඒ සඳහා නව මානවවාදී ප්‍රවේශයක් හෙළි කරන ආකාරය **හුණුවටයේ කතාව** ඇසුරෙන් පෙන්වා දෙන්න.

(6) පැවතෙන දේශපාලන ධාරාව සියුම් උපහාසයකට ලක් කිරීමට සයිමන් නවගත්තේගම සමත් වී ඇද්දැයි **සුබ සහ යස** නාට්‍යය ඇසුරෙන් විමර්ශනය කරන්න.

(අනෙක් පිට බලන්න.)

## III කොටස

(7) "නවකථාව යනු මානව ජීවිතය සූක්ෂ්ම ලෙස විවරණය කෙරෙන සාහිත්‍යාංගයකි." **ජීවක කුලයක්** නව කතාව ද ඇසුරු කරමින් උක්ත ප්‍රකාශය සමර්ථනය කරන්න.

(8) "**ජීවක කුලයක්** නවකථාවෙහි මූලික ධාරණාව වන්නේ වෙදකම ජීවනාලිය කරගත් දේශීය ග්‍රාමීය සංස්කෘතියේ බිඳවැටීම සියුම් ලෙස නිරූපණය කිරීම ය." මෙම අදහස සනිදර්ශන ව විවරණය කරන්න.

(9) **නූතන කෙටිකතා රචකයා** සමකාලීන සමාජ ප්‍රශ්න යථාර්ථවාදී ව නිරූපණය කරන ආකාරය අදාළ කෙටිකතා ද උපයෝගී කර ගනිමින් පැහැදිලි කරන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි.)